# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 967 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 09/06/2024 පැය0850

## මාධ්‍ය නිවේදනය

**අයිස් මත්ද්‍රව්‍ය, පතරොම් හා මුදල් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.06.08 වන දින දහවල් කාලයේ පානදුර දකුණ පොලිස් වසමේ නල්ලූරුව ප්‍රදේශයේදී ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සැකකටයුතු ලෙස යතුරුපැදියකින් පැමිණි පුද්ගලයෙකු පරීක්ෂා කර ඇත.

එහිදී එම සැකකරු ඔහු සන්තකයේ තිබූ **රිවෝල්වර අවි සඳහා භාවිතා කරන සජීවී පතරොම් 20 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක්, මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 4,249,900/- ක්, ජංගම දුරකථනයක් හා යතුරුපැදියද සමඟ** අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුගෙන් අනාවරණය වූ තොරතුරු මත සැකකරු සමඟ කුලී නිවසක සිටිමින් මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා ආධාර අනුබල දුන් තවත් සැකකරුවෙකුද ජංගම දුරකථනයක් සමඟ අත්අඩංගුවට ගෙන දෙදෙනාම පානදුර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන නල්ලූරුව, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර ආධාර අනුබල දීමට අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මොරවින්න, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුවන් දෙදෙනා සංවිධානාත්මක අපරාධකරුවෙකු හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු වන පානදුර කුඩු සලිඳු නැමැත්තාගේ මත්ද්‍රව්‍ය ජාවාරම් ඩුබායි රාජ්‍යයේ සිට සිදු කරනු ලබන ප්‍රධාන ගෝලයන් දෙදෙනෙකුගේ මෙරට මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවනු ලබන පුද්ගලයන් බවටත් මොවුන් වෙනත් අපරාධ වලට සම්බන්ධ අයවළුන් බවටත් දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. පානදුර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**